සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා 2 × 20 ලකුණු 40ක් හිමි වේ.

- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත් වීමටත්, ජීවිතය යහපත් ව පවත්වාගෙන යාමටත් සමාජයෙන් හිමිවිය යුතු රැකවරණය හා ආරක්ෂාව ........................................................................ වේ.
(සමාජ සුරක්ෂිතතාව / නීතියේ ආධිපත්‍යය / පුද්ගල සුරක්ෂිතතාව)

02. කිසිදු භේදයකින් තොරව නියමිත සුදුසුකම් සපුරා ඇති සියලු පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ............................................................ වේ. (සර්වජන ඡන්ද බලය / සීමිත ඡන්ද බලය / මැතිවරණ)

03. රටක සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීම සඳහා සකස් කරන දිගුකාලීන වැඩපිළිවෙළ ....................................................................... වේ.
(දේශපාලන ප්‍රතිපත්තිය / මැතිවරණ ප්‍රතිපත්තිය / ජාතික ප්‍රතිපත්තිය)

04. ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ආයතන විශේෂය ........................................................................... වේ.
(පළාත් සභා / පළාත් පාලන ආයතන / මධ්‍යම ආණ්ඩුව)

05. ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් අධිකරණය වෙත නොගොස් නිරාකරණය කර ගැනීම සඳහා පිහිටුවා ඇති ආයතනය ................................................................................. වේ.
(සමථ මණ්ඩලය / පොලීසිය / පළාත් සභා)

- ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති වගන්ති නිවැරදි නම් ( ✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. වර්තමාන සමාජය මුහුණ පා තිබෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාමයි. (............)

07. නීතියේ ආධිපත්‍යය නිසි පරිදි ක්‍රියාත්මක නොවන ඕනෑම සමාජයක යුක්තිය, සාමය හා සමාජ සුරක්ෂිතබව ආරක්ෂා වී තිබේ. (............)

08. ආර්ථිකයක පවත්නා සම්පත් මිනිස් වුවමනා ඉටුකරගත හැකි ආකාරයට වෙනස් කිරීම නිෂ්පාදනයයි. (............)

09. හිස නමා ආචාර කිරීම, සුමෝ ක්‍රීඩාව යනාදිය චීනයේ සංස්කෘතිකාංග කිහිපයකි. (............)

10. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට හා පාලන කටයුතු වලට පුරවැසියන් ඍජුව සම්බන්ධ වීම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි. (............)

● අංක 11 - 15 දක්වා පින්තූරය ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




11. සමුපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නේ ..................................................................... ය.

12. සාමාජිකයන් අතර ....................................................... වර්ධනය කිරීම් මෙම ව්‍යාපාරය මගින් අපේක්ෂා කෙරේ.

13. ............................................................................ යන්න සමුපකාරයේ ආදර්ශ පාඨය වේ.

14. ශ්‍රී ලංකාව තුළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන පාසල් සමුපකාර සමිතියකි ................................................................... විද්‍යාලයේ පාසල් සමුපකාර සමිතිය

15. ණයදෙන සමිති වෙනුවට කාර්ය රැසක් ඉටුකරගත හැකි වන පරිදි පිහිට වූ සමුපකාර සමිති .................................. ලෙස හැඳින්වේ.

● ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න හොඳින් කියවා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. අපරාධ නීතිය යටතට අයත් වන්නේ,
   i. ළමා අපයෝජන   ii. ඉඩම් ගැටලු   iii. දික්කසාද නඩු   iv. අයිතිවාසිකම්

17. ''සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම'' මෙම ආයතනයේ දැක්ම වේ.
   i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව   ii. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
   iii. නීතිපති දෙපාර්තමේන්තුව   iv. අධිකරණය

18. ශ්‍රී ලංකාවේ මුලින් ම ආරම්භ කළ මහනගර සභා 03 වන්නේ,
   i. කොළඹ, මහනුවර, යාපනය   ii. කොළඹ, ගාල්ල, යාපනය
   iii. කොළඹ, ගාල්ල, මහනුවර   iv. කොළඹ, මහනුවර, ගම්පහ

19. ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම සඳහා බලපාන සාධකයක් නොවන්නේ,
   i. රටතුළ අයහපත් ආර්ථික මට්ටමක් පැවතීම.
   ii. ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝධය ඉහළ මට්ටමක පැවතීම.
   iii. ප්‍රබල විපක්ෂයක් පැවතීම.
   iv. ජනමාධ්‍ය නිදහස පැවතීම.

20. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
   i. පළාත් සභා   ii. පුරවැසි සභාව   iii. නගර සභාව   iv. මහ සභාව

(20 × 2 = ලකුණු 40)


## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. සමාජ සුරක්ෂිතභාවය උදෙසා ආගමික ආයතනවලින් ඉටුකෙරෙන කාර්යයන් 02ක් ලියන්න.
ii. සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම හා සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා දායක වන ආයතන 02 ක් ලියන්න.
iii. නීතියේ මූලාශ්‍ර 02ක් සඳහන් කරන්න.
iv. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය භාවිතා කිරීමට ලැබෙන මැතිවරණ අවස්ථා 02ක් සඳහන් කරන්න.
v. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ඇතැන්ස් පෞර රාජ්‍ය තුළ පාලන කටයුතු සඳහා සම්බන්ධ කර නොගත් කණ්ඩායම් 02ක් සඳහන් කරන්න.
vi. ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාර 02ක් සඳහන් කරන්න.
vii. පුරවැසියකු සතු අයිතිවාසිකම් 02 ක් ලියන්න.
viii. ශ්‍රී ලංකාව තුළ ඡන්ද අයිතිය හිමිවීම සඳහා සපුරාගත යුතු සුදුසුකම් 02 ක් ලියන්න.

(2 × 8 = ලකුණු 16)

02. i. නීතිය යනු කුමක් දැයි සරලව නිර්වචනය කරන්න. (ල. 02)
ii. නීතියේ ගුණාංග 03ක් සඳහන් කරන්න. (ල. 03)
iii. (අ) දේශීය නීතිය බෙදෙන ප්‍රධාන කොටස් 03 සඳහන් කරන්න. (ල. 03)
(ආ) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය ඇසුරින් පහත සංකල්ප සිතියම සම්පූර්ණ කරන්න. (ල. 03)





03. i. තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර බලපෑම් 02ක් ලියන්න. (ල. 02)
ii. ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 03කි. ඒ මොනවාදැයි සඳහන් කරන්න. (ල. 03)
iii. පහත දක්වා ඇත්තේ කෘෂිකාර්මික හා කාර්මික අංශ තුළ ඇති වූ නවීන වෙනස්කම් රැසකි. ඒවා හඳුනාගෙන නිවැරදි ව වගුගත කරන්න. (ල. 06)

A. එකලස් කිරීමේ කර්මාන්ත
B. හයිඩ්‍රොෆෝනික්ස් වගාක්‍රමය
C. නිෂ්පාදන ක්‍රියාවලියකට රොබෝ තාක්ෂණය යොදා ගැනීම
D. විද්‍යුත් හා නැනෝ තාක්ෂණය
E. ජාන තාක්ෂණය
F. නිෂ්පාදන විවිධාංගීකරණය

| කෘෂිකාර්මික අංශය | කාර්මික අංශය |
|---|---|
| | |


04. i. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප 02ක් සඳහන් කරන්න. (ල. 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ කිහිපයක් පහත සටහනෙහි ලියන්න.




(ල. 04)

iii. පහත චාර්ට් සටහන සම්පූර්ණ කරන්න.




(ල. 05)

05. i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග 03 මොනවාද? (ල. 03)

ii. පහත දක්වා ඇත්තේ පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකම් හා මහජන නියෝජිතයන්ගෙන් නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් කිහිපයකි.

ඒවා නිවැරදිව හඳුනාගෙන වගුගත කරන්න.

A. කලට වේලාවට නියමිත බදු ගෙවීම.
B. සංවර්ධන කටයුතු නිසි පරිදි අධීක්ෂණය කිරීම.
C. ප්‍රදේශයේ සම්පත් හඳුනා ගැනීම.
D. සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම.
E. ඉදිකිරීම් වැනි කටයුතු වලදී නීත්‍යානුකූල අනුමැතිය ගැනීම.
F. ඉහළ ප්‍රමිතියකින් යුතුව සේවාව සැපයීම.
G. කසල හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී පළාත් පාලන ආයතනවලින් දෙන උපදෙස් පිළිපැදීම.
H. ජනතාවට ප්‍රියමනාප ස්ථානයක් බවට ආයතනය පත් කිරීම.

| පුරවැසි යුතුකම් | මහජන නියෝජිතයින්ගෙන් / නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් |
|---|---|
| | |

(ල. 08)


06. i. පළාත් පාලන ආයතනවලින් සැපයෙන සේවා 05ක් ලියන්න. (ල. 05)

ii. පළාත් පාලන ආයතනවලට පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා ඔවුන් මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාර 03ක් ලියන්න. (ල. 03)

iii. පහත සඳහන් ආයතනවල ප්‍රධානීන් කවුරුන්දැයි (මහජන නියෝජිතයින්) සඳහන් කරන්න. (ල. 03)

| ආයතනය | ප්‍රධානියා |
|---|---|
| ප්‍රාදේශීය සභා | 1. ............................................................ |
| නගර සභා | 2. ............................................................ |
| මහ නගර සභා | 3. ............................................................ |

07. ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට

1. නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා නොහැර මේ සඳහා යොමු කිරීම පුරවැසි වගකීමකි.
2. රටක් තම දේශසීමාව තුළ බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන නීතිය
3. විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවක් පිළිබඳ විසඳුම් සොයා ගැනීම ........... ලෙස හැඳින්වේ.
4. නියෝජන ක්‍රමයකි.
5. අන් අයට කරදරයක් නොවන ලෙස නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත්වීම මෙම නමින් හැඳින්වේ.

පහළට

6. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන යුරෝපා රටකි.
7. යුක්තිය පසිඳලීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යයකි.
8. තමන් කැමති පාලකයෙකු තෝරා ගැනීමට තම කැමැත්ත ප්‍රකාශ කිරීම.
9. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා
10. ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිවරයා ඇමරිකාව තුළ ....................................... සේවය අහෝසි කිරීමට පියවර ගත්තේ ය.
11. ප්‍රාදේශීයසභා/නගරසභා වල ප්‍රධාන පරිපාලන නිලධාරියා මෙනමින් හැඳින්වේ.

(ලකුණු 1 × 11 = 11)